# සංඝ සන්තක ගම්බිම්

## (මධ්‍යතන යුගය ක්‍රි.ව. 1215–1505)

**ආචාර්ය මැන්දිස් රෝහණදීර**

සියවස් පහළොහක් තරම් කාලයක් තිස්සේ ප්‍රධාන වශයෙන් රජරට තැනිතලාව ආශ්‍රයේ පැවත ආ සංඝයා පිළිබඳ වූ ආර්ථික සැලැස්ම පොළොන්නරු යුගය අග භාගයේ දී පිරිහෙමින් වුත් මාඝ ආක්‍රමණයේ දී මුළුමනින්ම බිඳ වැටිණි.[1] දඹදෙණියේ තුන් වැනි විජයබාහු වකවානුවේ සිට ප්‍රධාන වශයෙන් නිරිත දිග තැනිතලාව හා මලය දේශය තුළ වැඩෙමින් ආ ආගමික මධ්‍යස්ථාන ආශ්‍රය කොටගෙන සංඝයා සම්බන්ධ වූ ආරාම, වතුපිටි, දේපොළ මුල් කොට ගත් ආර්ථික සැළැස්මක් බිහිව වැඩෙන්නට විය. එය පරීක්ෂා කර බැලීම මේ නිබන්ධයේ අරමුණයි.

අපේ අධ්‍යයන යුගය තුළ ආගමික සංස්ථා හා සම්බන්ධ ඉඩ කඩම් විෂයෙහි ව්‍යවහාර වී ඇති පද කිහිපයක් තිබේ. ඒවායින් ඇතැමක් මුළු යුගය පුරා ව්‍යවහාර වී ඇති අතර තවත් සමහරක් කල් යාමක දී අළුත් පදයකට ඉඩ දී ව්‍යවහාරයෙන් ගිළිහී ගොස් ඇති සැටි ඉදිරි සාකච්ඡාවේදී පැහැදිලි වනු ඇත. මේ නිසා මේ අර්ථ පමණක් නොව ඒ අර්ථවල විපරිණාමය ද කෙරෙහි සැලකිලිමත් වන්නට අපට සිදුවේ.

### කුසලාන්

මේ මුළු යුගය පුරාම ව්‍යවහාර වී ඇති පදයක් නම් කුසලාන් යන්නයි, එය අනුරාධපුර යුගය අග භාගයේ සිටම ව්‍යවහාර වූවකි, ''...කුසලාන් කැරැ ගෙන දී'' යනුවෙන් දහ වැනි සියවසේ බදුලු ලිපියේ යෙදී ඇත.[2] ක්‍රි. ව. 1104 පිහිටුවුණු ලිපියක ''සපුගම් වත් වැ සර'' නම් ප්‍රදේශය මහ වෙහෙර බද වතුකුරු පිරිවෙනට කුසලාන් කොට පුද තිබේ.[3] පළමු වැනි විජයබාහුගේ අඹගමු ලිපියේ ''මෙනුවාක් තැන් කුසලාන් කොට'' යනුවෙන් යෙදී ඇත.[4] ඉදිරි සාකච්ඡාවේදී ද දැක්වෙන වෙනත් බොහෝ තන්හි යෙදෙන කුසලාන් ශබ්දය පිළිබඳව වියතුන් අතර එකඟතාවක් නැත.[5]

ඩී. ඇම්. ද ඉසෙඩ් වික්‍රමසිංහ මේ වචනයට 'පාන පත්‍ර' හෙවත් 'බොන භාජනය' යන අරුත දී ඇත.[6] එහෙත් කුසලාන් යන්න නිසැක වශයෙන්ම ඉඩකඩම් විෂයෙහි යෙදෙන්නක් බව මතු විමසන නිදර්ශන වලින් පැහැදිලි වනු ඇත. එහෙයින් වික්‍රමසිංහ දෙන අරුත පිළිගත නො හැක. එච්. සී. පී. බෙල් ජලවාචී 'කුස' ශබ්දය හා දන වාචී 'ලාන' ශබ්දය එක් වී කුසලාන් යන්න සෑදී ඇතැයි ගෙන, 'පැන් වත් කොට දෙන දීමනා' යන අර්ථය දී තිබේ.[7] පරණවිතාන බෙල් ඉදිරිපත් කළ මේ නිරුක්තියට වැඩි එකඟතාවක් නොදක්වතුදු, අර්ථයට මූලික වශයෙන් එකඟ වෙයි.[8] පුණ්‍යවාචී 'කුසල්' හා ස්ථාන වාචී 'ආන' ශබ්දය එකතුව කුසලාන සෑදී ඇතැයිද, ඉන් අදහස් වන්නේ 'කුසල් පිණිස පිදූ ගම්' යැයි ද වැලිවිටියේ ශ්‍රී සෝරත හිමි අදහස් කර තිබේ.[9] කුසල් ප්‍රකාශ කොට දෙන දීමනා යන අරුත් ඇති 'කුසල ශ්‍රාවණ' යන්නෙන් 'කුසලාන්' ශබ්දය ප්‍රභව විණැයි, ඩබ්ලිව්. ඇස්. කරුණාරත්න විශ්වාස කරන අතර,[10] 'කුසලදන' යන්නෙන් කුසලාන පදය ප්‍රභව විණැයි, සී. ඊ. ගොඩකුඹුර සිතා ඇත.[11]

මෙසේ බලන විට වචනයට දෙන නිරුක්ති ක්‍රම පිළිබඳව මත භේද ඇතද, වික්‍රමසිංහ හැරෙන විට අනිත් හැම වියතකුම 'කුසලාන්' යන්න පිළිබඳව 'කුසල් තකා පිදූ ඉඩම්' යන අර්ථයට මූලික වශයෙන් එකඟ වන බව පෙනේ.

**දරු කුසලාන් මහ කුසලාන්**

පොළොන්නරු යුගයේ කුසලාන් වර්ග දෙකක් පැවති බවට සාක්ෂි තිබේ. නිශ්ශංක මල්ලගේ **ගල්පොත ලිපියේ** 'දරු කුසලාන්, මහ කුසලාන්' පිදූ බවක් කියැවේ.[12] **දළද සිරිතේද,** 'දරු කුසලාන් මහ කුසලාන්' ව්‍යවහාරය දක්නට ලැබේ.[13] මෙහි දරු කුසලාන් මහ කුසලාන් යන්නෙන් අදහස් වන්නේ 'පින් තකා' පුදන ලද ලොකු කුඩා ඉඩම් යැයි බෙල් විශ්වාස කළේය.[14] වැලිවිටියේ ශ්‍රී සෝරත ස්ථවිරයන් ද මේ අදහස අනුමත කර ඇත.[15] අඹරන මහගල මවු ගල ලෙස ද, පළමුව ඇති වූ ගෙඩිය 'මවු ගෙඩිය' ලෙස ද, යළි කුඩා ගල දරු ගල ලෙස ද, කුඩා ගෙඩිය දරු ගෙඩිය හෙවත් දූ ගෙඩිය ලෙස ද, ගැමි වහරෙහි එන යෙදුම් මීට සාක්ෂි සේ ඉදිරිපත් කොට ඇත.[16]

**දිඹුලාගල මාර වීදියේ පර්වත ලිපියේ** ''දෙමළ පැහැ සිරි කුසලාන්'' යන පාඨයක් එයි.[17] ලිපිය සංස්කරණය කළ වික්‍රමසිංහ මෙතැන 'සිරි' යන්නට 'පූජ්‍ය' හෝ 'රාජකීය' යන අරුත් දී ඇත.[18]

දහ හතර වැනි සියවසේ ලියැවුණු **අත්තනගලු වංසයේ** මායා රට වුසූ 'සිරි වන්නිවරුන්' ගැන සඳහන් වෙයි.[19] 'සිරි වන්නි' යනු 'සම්පත් ඇති වන වාසි ජනයා' සේ ශ්‍රී සෝරත හිමි සළකා ඇත.[20] **පූජාවලිය** දෙ වැනි පරාක්‍රමබාහු සමයේ රජ රට සිටි 'මහ වන්නි වරුන්' ගැන කියයි.[21] මේ මූලාශ්‍රය දෙකේ යෙදී ඇති 'මහ වන්නි' හා 'සිරි වන්නි' යන වචන දෙක එක් කොට සළකන කල්හි, 'සිරි කුසලාන්' 'සිරි වන්නි' යන තන්හි එන 'සිරි' යන්න පූජ්‍ය, සම්පත් ඇති, යන අරුත්වලට වඩා වෙනත් අරුතක් නඟතියි සිතේ. ඒ තන්හි 'සිරි' 'මහ' යන්නේ විරුද්ධාර්ථය වූ 'කුඩා' යන අරුත නඟතියි ගැනීම වඩා යෝග්‍යය. එවිට 'සිරි වන්නි' කුඩා වන්නි වරුනැයිද 'සිරි කුසලාන්' කුඩා කුසලාන් යැයිද ගත හැකිය. ඇත්ත වශයෙන් කුඩා අරුත්හි 'සිරුක' ශබ්දයක් ද්‍රවිඩ භාෂාවෙහි ඇත.[22] යට දැක්වුණු තන්හි ඇති 'සිරි' යන්න දෙමළ 'සිරු' ශබ්දයෙන් හුරු වූවක් විය හැකිය.

මෙසේ ගන්නා විට **දිඹුලාගල ලිපියේ** එන 'සිරි කුසලාන්' යන්නද, දරු කුසලාන්ම බව හැඟී යයි. මේ නිසා 'මහ කුසලාන්' යනු කුසල් පිණිස පිදූ මහ ගම් යැයි ද, දරු කුසලාන් හෙවත් සිරි කුසලාන් කුසල් පිණිස පිදූ කුඩා ගම් යැයි ද දෙන අරුත පිළිගත හැකි බව පෙනේ. එවිට කුසල් පිණිස පිදූ ඉඩම් හෙවත් කුසලාන් වර්ග දෙකක් සේ හැඳින්වෙන්නට පටන් ගත්තේ ඒවායේ ලොකු කුඩා ප්‍රමාණය සළකා ගෙන බව පැහැදිලි වෙයි.

මේ කුඩා කුසලාන් හෙවත් 'දරු කුසලාන්' යන ව්‍යවහාරය පොළොන්නරු යුගයෙන් පසු අභාවයට ගිය බවක් පෙනේ. පොළොන්නරු යුගයෙන් පසු සෙල්ලිපිවල අදාළ තොරතුරු එන තන්හි 'දරු කුසලාන්' යන්න යෙදී නැත. මේ යුගයේ සාහිත්‍ය මූලාශ්‍ර යන්ගෙන් **දළද සිරිත** හැරුණු විට[23] අනෙක් මූලාශ්‍රයවල මෙබඳු දීමනා කියවෙන තන්හි 'දරු කුසලාන්' යන්න වෙනුවෙට යෙදී ඇත්තේ 'දරු ගම්' යන්නයි.[24]

**දරු ගම්**

දරු ගම් යන්න දරු කුසලාන් යන්නට සමාන සේ පරණවිතාන ද,[25] ශ්‍රී සෝරත හිමිද[26] සළකා ඇත. මේ අනුව අපට නිගමනය කළ හැක්කේ පොළොන්නරු යුගයෙන් පසු දරු කුසලාන් යන්න 'දරු ගම්' සේ ව්‍යවහාර වන්නට පටන් ගෙන ඇති බවය. එවිට ඇත්ත වශයෙන් 'දරු ගම්' යන්නෙන්ද අදහස් වන්නේ 'කුසල් සඳහා පිදූ කුඩා ගම්' යැයි පිළිගන්නට සිදුවේ.

**දරු ගම් වටනා පස**

අනෙක් වැදගත් කරුණ නම් දඹදෙණි සමයේ සිට මේ 'දරු ගම්' යන්න තනිව නො යෙදීමය. ඉහත දක්වූ තන්හි එය යෙදී ඇත්තේ 'දරු ගම් වටනා පස' යනුවෙන් යුගල පදයක කොටසක් ලෙසය. යටත්පිරිසෙයින් දහ හතර වැනි සියවසේ අග භාගය වන තෙක් යෙදී ඇති මේ යුගල පදයේ ඇති 'වටනා පස' යන්න දඹදෙණි යුගයෙන් ඔබ්බෙහි ලේඛණවල යෙදුණු තැනක් හමුව නැත. මින් පෙනෙන්නේ 'වටනා පස' යන්නද, දඹදෙණි යුගය තරමේ සිට 'දරු ගම්' යන්න සමගම ව්‍යවහාරයට පත් වෙමින් ආවක් බවය.

'වටනා පස' යන්නෙහි අර්ථය සළකා බැලීමට මෙතැනදී සිදු වෙයි. මෙහි 'පස' යන්න ප්‍රත්‍යය වෙනුවට යෙදුණක් බව පැහැදිලිය. 'වටනා' යන්න 'පැවැත්ම', 'නඩත්තු කිරීම' යන අර්ථ ඇති සංස්කෘත 'වෘත්' ධාතුවෙන් සිද්ධ 'වෘත්ති, 'වර්තනා' හෝ පාලි 'වට්ට' යන පදවලට සමාන විය හැකැයි පරණවිතාන සළකයි.[27] ශ්‍රී සෝරත ස්ථවිරයන්ද 'වටනා' යන්නට 'උපස්ථාන, පැවැත්මට ඉවහල් වන' යන අරුත් දී ඇත.[28] මේ අනුව 'වටනා පස' යන්න වෙනුවට 'භික්ෂූන්ගේ පැවැත්මට වහල් වන ප්‍රත්‍යය' යන අරුත පිළිගැනී ඇත.

එසේ වුවද **පූජාවලිය** දෙවැනි පරාක්‍රමබාහු විසින් පෙර සිරිත් ව්‍යවස්ථා කොට දුන් ගම් අතර පළමු වැනිව සඳහන් කොට ඇති 'වටනා පස' යන්න **චූලවංස** කරු පාලියට නගා ඇත්තේ 'කප්පිය පච්චය ගාම' යනුවෙන් බව මෙහිදී සිහිපත් කළ යුතුය.[29] මෙතැන 'පච්චය' යනු ප්‍රත්‍යය බව පැහැදිලිය. එවිට 'කප්පිය' යන්න යොද ඇත්තේ 'වටනා' යන්න සඳහා බව පෙනේ. 'කප්පිය' යනු කැප, සුදුසු, යෝග්‍ය යන අර්ථයි.[30] විනයට අනුව භික්ෂූන්ට පරිහරණය කළ හැක්කේ 'කැප යැ'යි 'සුදුසු යැ'යි පිළිගැන්වූ ප්‍රත්‍ය පමණකි. මේ නිසා 'වටනා පස' යනු 'කැප, සුදුසු' හෙවත් 'යෝග්‍ය ප්‍රත්‍ය' යන අරුත් දෙතියි සිතන්නට ඉඩ තිබේ. ඇත්ත වශයෙන් 'සුදුසු' 'යෝග්‍ය' යන අරුත්හි 'වට' ධාතුවක් සිංහලයේ ඇත.[31] ඒ අනුව කැප සුදුසු යන අරුත්හි වටනා වැනි රූපයක් යෙදිය හැකිය.

සමන් දේවාලයේ පිරිත් කීමට හා විහාරයේ කටයුතු පවත්වා ගැනීමට භික්ෂූන් තුන් නමක් නියම කොට, ඔවුන් වහන්සේලාට ''නිසි ලෙස සතර පසයෙන් උපස්ථාන විදීමට යෝග්‍යවූ 'ග්‍රාම ක්ෂේත්‍ර' දුන් බව'' **මහ සමන් දේවාල සන්නසේ** කියවේ.[32] මෙතැන මේවා දී ඇත්තේ සතර පසය සඳහා බව පැහැදිලිය. මෙහි යොද ඇති 'යෝග්‍ය' යන්න 'වටනා' යන පදයේ ඇති අරුතින් යෙදිණැයි හැඟේ.

**මේ නිසා** 'වටනා පස' යනු 'භික්ෂූන්ගේ පැවැත්මට ඉවහල් වන ප්‍රත්‍ය ලැබෙන 'ගම්' යන අරුතට වඩා භික්ෂූනට 'කැප, යෝග්‍ය' ප්‍රත්‍ය ලැබෙන ගම් යන අරුත ගැළපෙන බව අපගේ අදහසයි.

**පූජාවලියේ** යෙදුණ 'දරු ගම් වටනා පස' යන පද දෙකම වෙනුවට **චූලවංසයේ** තවත් තැනක 'කප්පිය පච්චය ගාම' යන්න පමණක් යොදා ඇත.[33] මින් වැටහෙන්නේ **චූලවංසය** 'දරු ගම්' වෙනම අරුත් දිය යුතු පදයක් සේ සළකා නැති බවකි. මේ අනුව මුලදී 'දරු කුසලාන්' වශයෙන් තිබී, දඹදෙණි යුගය වන විට 'දරු ගම්' බවට පත්ව ඇති වචනය, එම යුගයේ සිට 'වටනා පස' යන අළුත් වචනයක් සමග එකට යෙදෙමින් වුත්, **චූලවංසය** ලියවෙන කුරුණෑගල සමය වන විට තම අළුත් සගයා වන 'වටනා පස' යන්නට ඉඩදී අප්‍රධාන තත්වයකට පත් වන සැටි පෙනේ.

ඇත්ත වශයෙන් මෙසේ අප්‍රධාන වෙමින් පැවති මේ 'දරුගම්' යන්න පහළොස් වැනි සියවස වන විට 'වටනා පස' යන්නට ඉඩ දී ව්‍යවහාරයෙන් මුළුමනින්ම ගිළිහී ගොස් ඇති බව පෙනේ. පසළොස් වැනි සියවසේ ලේඛණවල 'දරු ගම් වටනා පස' යන යුගල ව්‍යවහාරය යෙදී ඇති බවට සාක්ෂි නැත. ඒ වෙනුවට එබඳු තන්හි 'දරු ගම්' යන්න නො මැතිව 'වටනා පස' යන්න පමණක් යෙදී ඇත. මින් හැඟෙන්නේ පොළොන්නරු යුගයේ 'කුසල් පිණිස පිදූ කුඩා ගම්' යන අරුතින් පැවති 'සිරි කුසලාන්' හෙවත් 'දරු කුසලාන්' දඹදෙණි සමය වන විට 'දරු ගම්' බවට පත්වී, 'කැප පස ගම්' යන අරුත් දෙන 'වටනා පස' සමග යුගල පදයක් සේ යෙදෙමින් වුත්, පසළොස් වැනි සියවසේදී 'වටනා පස' යන්නට ඉඩදී ව්‍යවහාරයෙන් ගිළිහී ගිය බවයි. මේ වනාහි 'වටනා පස' යනුද, භික්ෂූන්ට කැප පස සඳහා පිදුණු කුඩා ඉඩම් යැයි නිගමනයට බසින්නට කෙනකු පොළඹවන අර්ථ විපරිණාමයකැයි සිතීම සාධාරණය.

මෙසේ සළකන විට **පැපිළියාන සෙල්ලිපියේ** ''නිකපය ගම පිරිවෙනට වටනා පස දනයට පවතිනුව'' යන පාඨයෙන් හැඟෙන්නේ සුනේත්‍රාදේවි පිරිවෙනේ සිටින භික්ෂූන්ගේ කැප පස දනය පිණිස නිකපය ගම වෙන් කොට තිබුණු බවයි.[34] නාකොළගනේ පර්වත ලිපියේ එන 'නාගලට වටනා පසයට පිදූ මුගයින,[35] යන්නෙන්ද කියවෙන්නේ නාගල සිටි භික්ෂූන්ට කැප පස ලබා ගනු සඳහා පිදූ ඉඩමක් ගැනය.

**අරම්කැලේ සන්නසේ** එන 'විදගම මහතෙරුන්ට වටනා පස කොට දුන් මැද ගම දෙළසමුණේ වපසරිය'[36] යන පාඨයෙන් 'දෙළසමුණේ වපසරිය' 'වටනා පස' නමින්ම හැඳින්වූ බවක් ද හැඟී යයි. මේ සන්නසේම ඊළඟට යෙදී ඇති 'මැද ගොඩ වටනා පසය' යන්නෙන්[37] ඒ බව වඩාත් තහවුරු වෙයි. මේ අනුව නිගමනය කළ හැක්කේ පසළොස් වැනි සියවස වන විට භික්ෂූන්ගේ කැප පස සඳහා දුන් ඉඩම් ද අභේදෙපචාරයෙන් 'වටනා පස' යනුවෙන් හැඳින්වී ඇති බවය.

පහළොස් වැනි සියවස තරම වන විට 'දරු කුසලාන්, දරු ගම්' යන ව්‍යවහාර ගිළිහී ගොස් ඇති හැටි ඉහත විමසා බැලීමු. එසේ වන විට 'දරු කුසලාන්', යන්නෙහි විරුද්-ධාර්ථවත් පදය සේ පොළොන්නරු යුගයේ පැවති 'මහ කුසලාන්' යන්නද ව්‍යවහාරයෙන් ගිළිහී ගිය බව පෙනේ. **දළඳ සිරිත** හැරෙන විට දඹදෙණි යුගයෙන් මෙපිට ලෙඛණවල 'මහ කුසලාන්' යන්න ව්‍යවහාර වී ඇති බවක් නො පෙනේ. ඒ වෙනුවට බොහෝ තන්හි යෙදී ඇත්තේ තනිකර 'කුසලාන්' යන්න පමණය. මෙය පහසුවෙන් වටහා

ගත හැකිය. 'දරු කුසලාන්, දරු ගම්' යන ව්‍යවහාර නො පවත්නා විටක, එහි විරුද්ධාර්ථවත් වචනය සේ යෙදුණු 'මහ කුසලාන්' යන්න අර්ථ විරහිත වෙයි. එවිට 'කුසලාන්' යන්න පමණක් යෙදූ විට මහ කුසලාන් යන්නෙන් හැඟුණ ''කුසල් පිණිස පිදුණු මහ ඉඩම්'' අදහස් වෙයි.

මේ අයුරින් බලන විට සාසනික සංස්ථා සඳහා පිදුණු ඉඩම් 'වටනා පස' 'කුසලාන්' යනුවෙන් වර්ග දෙකක්ව පැවතිණැයි නිගමනය කළ හැකියි. දහසය වැනි සියවසට අයත් නාකොළගනේ පර්වත ලිපියේ 'නාගලට වටනා පසයට පිදී මුගයිනයි, නාගලට කුසලානට පිදී කුඩා මුගලන මහ මුගලනයි'[38] යන ව්‍යවහාරයෙන් මේ අදහස වඩාත් තහවුරු වෙයි.

එහෙත් සාසනික සංස්ථාවලට පිදුණු සියලුම ඉඩම් අනිවාර්යයෙන් මේ වර්ග දෙකින් එකකට අයත්ව පැවතිණැයි නිශ්චය කළ නො හැකිය. 'කුසලාන්' 'වටනාපස' වැනි හැඳින්වීමකින් තොරව කියවෙන ඉඩම් ගැන බොහෝ සාක්ෂි ලැබෙන හෙයිනි.

'වටනාපස' භික්ෂූන්ට කැප ප්‍රත්‍ය සම්පාදනය සඳහා වෙන්වුණු ඉඩම් බව ඉහත දුටුමු. ඒ අනුව කුසලාන් ඊට වඩා පොදු අවශ්‍යතා සඳහා පිදුණු ඉඩකඩම් යැයි සිතිය හැකිය.

ඉහත සඳහන් කළ පළමු වැනි විජයබාහුගේ පණස් වැන්නේ, එනම් ක්‍රි.ව. 1104 පිහිටුවුණු ලිපියක ''පොළොන්නරු වරුපෙත තුළවූ සපුගම් ගම් වත් 'වැසර' නම් ප්‍රදේශය මහ වෙහෙර බද වතු කුරු පිරිවෙනට කුසලාන් කොට'' දී ඇත්තේ වතුකුරු පිරිවෙනේ මහ පිළිමගෙය ප්‍රතිසංස්කරණය සඳහාය.[39] පළමු වැනි විජයබාහුගේ තිස් පස් වැන්නේ, එනම් ක්‍රි. ව. 1145 වැන්නේ පිහිටුවුණු කටගමු පුවරු ලිපියේ තළා මුහුදු ගිරි විහාරයට දහතුන් අමුණක වපසරිය කුසලාන් කොට තිබේ.[40] මෙතැන විශේෂ අවශ්‍යතාවක් ගැන නො කියැවේ. කළ්‍යාණවතී බිසවගේ පස් වැන්නේ එනම් ක්‍රි.ව. 1202 සෙනෙවිරත් පිරිවෙන් විහාරයට බිජුවට සතර මුණක් කුසලාන් කොට දුන් බව බතලගොඩ විහාර සෙල්ලිපියේ එයි.[41] ගලපාත ලිපියේ ගලපාත විහාරයට දුන් ඉඩම් කීපයක් අතර සියඹලාපය නම් ඉඩමක්ද ඊට යාබද සුඹුල්පත් ඇල්ල ඇතුළුවූ තැන කුඹුරු හා පොල් පුවක් ඇතුළු කොළ වෙල් අයද[42] විහාරයේ වසන වහන්දෑ වරුන්ගේ ප්‍රත්‍ය පිණිස කුසලාන් කොට දුන් බවක් කියැවේ[43] ගලපාත ලිපිය පළමු වැනි පරාක්‍රමබාහු සමයේ යැයි ගතහොත් එසමයේ ප්‍රත්‍ය සඳහාද කුසලාන් දී තිබෙන බව මින් පැහැදිලි වේ.

ඉහත කරන ලද සමීක්ෂණයෙන් අපට පහත සඳහන් නිගමනවලට බැසගත හැකිය. අපගේ සමාලෝචනයට භාජනය වන ක්‍රි.ව. දහ තුන් වැනි දහ හතර වැනි හා පහළොස් වැනි සියවස් තුන තුළ සංඝ සන්තක ඉඩකඩම් හඳුන්වනු සඳහා පොදුවේ ව්‍යවහාර වූ එක් පදයක් නම් 'කුසලාන්' යන්නයි. එය 'කුසල් පිණිස දෙන්නාවූ ඉඩම්' යන අරුතින් යෙදුණකි. පොළොන්නරු යුගය තරමේ මේ කුසලාන්, 'දරු කුසලාන්' 'මහ කුසලාන්' යනුවෙන් කුසල් පිණිස පිදූ කුඩා ඉඩම් හා මහ ඉඩම් යන දරුතින් දෙවර්ගයක් සේ යෙදී ඇති අතර දඹදෙණි සමයේ ඒවා සිරි කුසලාන් මහ කුසලාන් යනුවෙන් යෙදී ඇත. පසුව සිරි කුසලාන් වෙනුවට දරුගම් වටනාපස යන යුගල පදයක් යෙදමින් වුත් පසළොස් වැනි සියවසේ දරුගම් ගිලිහී වටනා පස පමණක් යෙදුණු අතර සංඝ සන්තක ඉඩකඩම් සඳහා කුසලාන් හා වටනාපස යන පද දෙක පමණක් යෙදී තිබේ.

මේ වටනාපස යන්න සංඝයාට කැප හෙවත් යෝග්‍ය ප්‍රත්‍ය සඳහා පිදුණු කුඩා ගම් යන අරුත් නඟන අතර කුසලාන් යන්න කුසල් පිණිස පුදන ලද විශාල ගම් යන අරුත නඟතියි පිළිගත හැකිය.

මෙසේ දහසය වැනි සියවස පමණේ සිට සංඝ සන්තක ඉඩකඩම් කුසලාන් වටනා-පස යන දෙවර්ගයක් සේ ව්‍යවහාර වූ අතර යළි ඒ දෙවර්ගයම සංඝ සමාජයේ විවිධ සංස්ථා සම්බන්ධයෙන් යෙදෙන කල වෙන වෙන නම් වලින් හඳුන්වා තිබේ. පාරිවේණිකගාම, පුග්ගලික ගාම, ගණසන්තකගාම, ආයතනගාම, සංඝගාම යනාදි වශයෙනි.

## පාරිවේණික ගාම

කුසලාන් පමණක් නොව වටනා පසද බොහෝ කොට පිරිවෙන්වලට දී ඇත. සුනේත්‍රා දේවි පිරිවෙනේ වටනා පස දනය පිණිස නිකපය ගම පැවති බව ඉහත දුටුමු. දෙ වැනි පරාක්‍රමබාහු රජු සිරිවර්ධන පුර තමා නමින් පිරිවෙනක් කරවා එයට දරු ගම් වටනා පස දී' තිබේ.[44] තුන්වැනි විජයබාහු කුරුණෑගල බුවනෙකබාහු පිරිවෙන කරවා එයට 'දරුගම් වටනා පස' පිදීය.[45] රුහුණු මගුල් මහ වෙහෙරෙහි විහාර මහා දේවිය කරවූ විහාර මහා දේවි පිරිවෙනට 'දරු ගම් වටනා පස'දී තිබේ.[46] හතර වැනි පරාක්‍රමබාහු තමා කරවූ ශ්‍රී පරාක්‍රමබාහු පිරිවෙනට ගම් බිම් වටනා පස දී තිබේ.[47] චූලවංසයට අනුව මේ පිරිවෙනට ගම් බිම් සතරක් දී තිබේ. ඒ පුරාණ ගාම, සන්නීර සෙල, ලබු-ජමණ්ඩුක, මොරවංක යන සතරය.[48] හතර වැනි පරාක්‍රමබාහු ගිම්හ නදී තීරයේ වූ පාලග්ගාම නම් ගම් තොටගමු පිරිවෙන සන්තක කොට දී තිබේ. මෙසේ බලන විට පිරිවෙන් සතුව කුසලාන් මෙන්ම වටනා පස ගම්ද පැවතුණු බව පෙනේ.

දෙ වැනි පරාක්‍රමබාහු දෙමළුන් විසින් නැසූ හෙයින් පෙර සේම ව්‍යවස්ථා තබා දුන් ගම් අතර 'පිරිවෙන් තැන්' සඳහන් වෙයි.[49] මේ 'පිරිවෙන් තැන්' වෙනුවට චූලවංසයේ යෙදී ඇත්තේ පාරිවේණික ගාම[50] යන්නය. මේ පිරිවෙන් තැන් හෙවත් පාරිවෙණික ගාම යනුවෙන් හැඳින්වුණේ ඉහත දුටු පිරිවෙන් සතුව පැවති කුසලාන් හා වටනා පස ගම් යැයි නිගමනය කළ හැකිය.

## පුග්ගලික ගාම

විල්ගම් මූළ මාහිමියන් තමන්ට රාජදත්තයෙන් හෙවත් රාජ දීමනාවෙන් ලැබුණු පානබුණු බද පොළොන්නාවෙන් කුඹුරු බිජුවට දෙයාළ පසමුණක් හා මේ හා සම්බන්ධ ගෙවතු බිම් බෝධින් වහන්සේට 'හිර සඳ පුමුණුකොට' දී තිබේ.[51] මේ තැන මේ ඉඩම් කුසලාන් හෝ වටනා පස යනුවෙන් විශේෂයෙන් හඳුන්වා නැත.

හය වැනි බුවනෙකබාහු රජ වීදගම මෛත්‍රෙය මහතෙර ස්වාමීන්ගෙන් බණ අසා සතුටුව දඹදෙණි කෝරළය බද මැදගොඩ ගම බිජුවට දෙළොසමුණක් ඒ හිමියන්ට වටනා පස කොට දී තිබේ. යළි එතුමා තම ශිෂ්‍ය තියඳවනේ පුස්සදේව හිමියන්ගේ ධර්ම වාක් පටුත්වය ගැන පැහැදී තමා දන් ලත් ඒ මැදගොඩ වටනා පසය තම ශිෂ්‍යයාට දී තිබේ.[52] මේ නිදසුන්වලින් කියැවෙන වටනා පස ඇතුළු ගම් තනි පුද්ගලයන් සතුව පැවති ඒවා බව පෙනේ.

දෙ වැනි පරාක්‍රමබාහු පෙර සේ ව්‍යවස්ථා කොට දුන් ගම් අතර පුහුල් තැන් හෙවත් පුද්ගලික ගාම සඳහන් වේ.[53] මෙතැන පුහුල් තැන් හෙවත් පුද්ගලික ගාම යනුවෙන් හැඳින්වෙන්නේ ඉහත දුටු පුද්ගලයන් සතුව පැවති කුසලාන් ගම් හා වටනා පස ගම් බවට අඩමානයක් නැත.

**ගණ සන්තක ගාම**

පිරිවෙන් හා පුද්ගලයන් හැරෙන විට විහාර සතු කුසලාන් හා වටනා පස පැවති බව පෙනේ. **ගලපාත ලිපියේ** ගලපාත විහාරයේ වැඩ හිඳිනා වහන්දෑ වරුන්ට ප්‍රත්‍ය පිණිස දුන් ඉඩම් ගැන කියවේ.[54] ඉහත දුටු නාගලට පිදූ කුසලාන් හා වටනා පසද නාගල විහාරය සතු ඉඩම් බව පෙනේ. කුසලාන් වටනා පස යන නාමයෙන් නො හැඳින්වුණද විහාර සන්තකව පැවති ගම්බිම් ගැන තවද තොරතුරු ලැබේ.[55]

දෙ වැනි පරාක්‍රමබාහු පෙර සේ ව්‍යවස්ථා කරවා දුන් ගම් බිම් අතර 'ගණ සන්තක ගාම' හෙවත් 'ගණ තැන්' යන්නක් වෙයි.[56] විහාරයද ඒ විහාරයෙහි සිටි භික්ෂූන්ද ගණ නමින් හැඳින්විණැයි අප විසින් අන් තැනක පෙන්වා දී ඇත.[57] පරාක්‍රමබාහු පෙර සේ ව්‍යවස්ථා කොට දුන් ගම් අතර එන 'ගණ තැන්' ගණ සන්තක ගාම, ඉහත දුටු විහාර සන්තක කුසලාන හා වටනා පස ඇතුළු ඉඩකඩම් යැයි නිශ්චය කළ හැකිය.

**ආයතන ගාම**

දෙවැනි පරාක්‍රමබාහු පෙර සේ ව්‍යවස්ථා කරවා දුන් ගම් බිම් අතර 'අයතැන්' හෙවත් 'ආයතන ගාම' යන්නක් සඳහන් වේ.[58] **චූලවංසයේ** මෙය 'අට්ඨායතනගාම' යනුවෙන් සඳහන් වේ.[59]

එසේ වුවද අයතැන් සතුව පැවතිණැයි සිතිය හැකි කුසලාන් හෝ වටනා පස ගැන සාක්ෂි විරළය. ලෝකේශ්වරගේ **කොට්ටන්ගේ ලිපියට** අනුව 'ලොකේ අරක්මේනාවන්ට කළම' නම් පමුණුවක් දී තිබේ. මේ පමුණුව 'විල්ගම් මුළ වපසිනා ආයතන් නායක මාළුවරුන් වහන්සේගෙන් කන්ලැව් පසිඳවා මාපඩි වංශයේ වුවන් වැළඳිය යුතු'යැයි නියමයක් කොට ඇත.[60] මෙහි 'කන්ලැව් පසිඳවා' යනු 'ආරවුල් සමථයකට පත් කරවා' යනුවෙන් පරණවිතාන අරුත් දී ඇත.[61]

පමුණුව දී තිබෙන්නේ ලෝකේ අරක්මේනාටය. එය භුක්ති විඳිමේදී විල්ගම් මූළ වපසිනායතන්නායක මාළුවරුන් ලවා කන්ලැව් පසිඳ විය යුතු බවට ඇති නිගමනය අනුව එම පමුණුව පිළිබඳව කිසියම් වගකීමක් විල්ගම් මූළ ආයතනයට තිබිණැයි හැඟී යයි. කෝට්ටන්ගේ රීළඟ ලිපියෙන් ඒ කියන පමුණුව විල්ගම් මුළ අභය නම් මහතෙරුන් සතු බවත්, එතුමා එය සඟ සතු කොට පුදා ඇති බවත් හෙළිවේ.[62] මේ කියන විල්ගම්මූළ අභය මහතෙරුන් තත්කාලීන විල්ගම්මූළ ආයතන්නායක විය හැකැයි අප විසින් අන් තැනක පෙන්වා දී ඇත.[63] එසේ වුවහොත් එතුමාට කළම පමුණුව උරුමව ඇත්තේ ආයතන නායක වීම නිසා යැයි පිළිගත හැකිය. එවිට කළම පමුණුව ආයතන් ගාමයන් යැයි අනුමාන කළ හැකිය.

එසේ වුවද මේ නිදසුන හැරෙන විට ආයතන සන්තක ගාම ගැන වෙනත් නිදසුන් නැති නිසා ඒවායේ ස්වරූපය ගැන වැඩිමනත් විග්‍රහයක් දැනට කළ නො හැකිය.

දෙවැනි පරාක්‍රමබාහු පෙර සේ ව්‍යවස්ථා කොට දුන් ගම් ගැන සඳහන් කරන **චූලවංසය** ‘බුද්ධ ධම්මායත්ත ගාමාරාමාදිය ද, එසේම’ යනුවෙන් පටන් ගෙන ඉහත සළකා බලන ලද කප්පිය පච්චයගාම ආදී ගම් වර්ග පහ ගැන කියයි.[64] මින් බුද්ධ ධම්ම දෙරත්නය සඳහා වෙනම ගාමාරාමාදිය තිබුණු අතර, කප්පිය පච්චියගාම, (**පුව.,** වටනා පස), ගණ සන්තක ගාම, (ගණතැන්), පුද්ගලික ගාම, (පුඟුල් තැන්), අව්‍යායතන ගාම, (අයතැන්), පාරිවෙණික ගාම, (පිරිවෙන් තැන්), යන මේවා සංඝරත්නය පිළිබඳ ගම් බවද පැහැදිලි වෙයි.

**සංඝ ගාම, සංගමු**

ඇත්ත වශයෙන් මේ ගම් වර්ග සංඝයා සම්බන්ධ ගම් බව ඉහත කළ සමීක්ෂණයෙන් පැහැදිලි විය. සංඝයා සම්බන්ධ වූ මේ ගම් පොදුවේ ‘සංඝ ගාම’ බඳු වචනයකින් හැඳින්වුණු බවට සාක්ෂි තිබේ. නිකාය සාමාග්‍රියට පළමු සංඝයා සිටි තත්ත්වය ගැන කියන චූලවංසය ‘සංඝ ගාමවල සංඝයාගේ පුත්‍ර දරාදීන් පොෂණය කිරීම හැර අන් සීලයක් නැතුවාක් මෙන් එවක භික්ෂූන් කාලය ගෙවමින් සිටියහ’යි පවසයි.[65] මෙතැන සංඝ ගාම යනුවෙන් හඳුන්වන්නේ ඉහත දුටු පිරුවන්, පුද්ගල, ගණ, හා ආයතන සන්තකව පැවති කුසලාන් හා වටනා පස ඇතුළු ගම් යැයි නිගමනය කළ හැකිය.

**දඹදෙණි කතිකාවතේ** පෙනෙන ‘සංගමු’ යන්න මේ සංඝගාම යන්නේ සිංහල ස්වරූපයම බවට සැක නැත. මේ කතිකාවත ආයතන් නායකකම සඳහා එක සුදුසුකමක් වශයෙන් ‘සංගමු ගණවැසි ගම්වල අඛණ්ඩව සන්තතීන් පැවත ඒම’ දක්වා ඇත.[66] මින් අදහස් වන්නේ ආයතන් නායක තනතුරට පත් වන ස්ථවිරයන් සංගමු ගණවැසි ගම්වල අඛණ්ඩ පරම්පරාවෙන් පැවත ආ කෙනකු විය යුතු බවය. මෙතැන කියවෙන සංගමු ඉහත දුටු පාරිවේණික, පුද්ගලික ආදී වශයෙන් පැවති වටනා පස හා කුසලාන් ගම් විය යුතුය.

‘සංගමු ගණවැසි ගම්හි අඛණ්ඩ සන්තතීන් ආ’ යන්නෙන් අදහස් වන්නේ සංගමු ගණවැසි යන පවුල්වලින් පැවත ආ යන්නයැයි පරණවිතාන අදහස් කරයි.[67] සංගමු, ගණවැසි යනු වංශ දෙකක් සේ පරණවිතාන සළකා ඇති සැටි මින් පැහැදිලි වෙයි. ගණ-වැසි නමින් වංශයක් ගම්පළ කෝට්ටේ යුගවල පැවති බව ප්‍රකට කරුණකි. එහෙත් සංගමු නම් වූ වංශයක් ගැන කිසිදු සාක්ෂියක් නො ලැබේ.

අනෙක් අතින් ‘සංගමු’ යනු සංඝයා සඳහා පැවති සංඝගාම විය හැකි බව ඉහත සළකා බැලුමු. ‘‘තුන් රජයෙහි සංගමු ගණවැසි ගම් ප්‍රසිද්ධ බැවින්ද’’ යන කතිකාවත් පාඨය යෙන්ද,[68] මේවා ගම් බව පැහැදිලි වෙයි. සංගමු ගම් ඉහත දුටු සංඝ සන්තක කුසලාන් හා වටනා පස සේ හඳුනා ගත හැකි වුවද, ගණවැසි නමින් කිසියම් ගම් විශේෂයක් පැවති බවට සාක්ෂි නො ලැබේ. ගණ සන්තක ගාම හෙවත් ගණතැන් නම් වූ ගම් විශේෂයක් ඉහත දුටුමු. ගණවැසි යනු මේ ගණතැන් විය හැකිද? එහෙත් ගණතැන් ගණ සන්තක ගාම යන වචන වෙනුවට ගණවැසි යන වචනයක් ව්‍යවහාරයට එන්නට වාග් විද්‍යානුකූලව නම් එතරම් ඉඩක් නැත.

ඉහත දුටු ගම් බිම් ප්‍රදානයන්හිදී බොහෝ විට ඒවායේ විස්තරාංගද විශේෂයෙන් සඳහන් කොට දීම සිරිතක්ව පැවති බව පෙනේ. **ගලපාත ලිපියේ** සියඹලාපයද එයට සම්බන්ධ (මෙහි මැ බඳ) සුඹුලුපත් හැල්ල ඇතුළුව තැන කුඹුරුද, එහි පොල් පුවක් ඇතුළු වූ කොළවෙල් අයද ගැන විශේෂයෙන් සඳහන් කොට තිබේ.[69]

### කොළවෙල් අය

මෙහි කියවෙන 'කොළවෙල් අය' යන්නෙහි අර්ථය පැහැදිලි නැත. කොළවෙල් නම් වගාවෙන් ලැබෙන ආදායම යැයි පරණවිතාන සිතා ඇත.[70] අය යනු ආදායම බව පැහැදිලිය. එහෙත් කොළවෙල් නම් වගාව කවරක්දැයි පැහැදිලි නැත. 'පොල් පුවක් ඇතුළුවූ කොළවෙල්' යන පාඨයෙන් පොල් හා පුවක් කොළවෙල් වගාවක් සේ සැළකුණු බව පැහැදිලි වෙයි. 'වල් කපා කොළවෙල් හිඳුවා' යන පාඨයෙන් කොළවෙල් කිසියම් වගාවක්ම බව පැහැදිලි වේ. පසුකාලීන ලිපිවල මේ (කොළවෙල්) යන වචනය යෙදී නැත. එබඳු තැන්හි යෙදී ඇත්තේ 'ගෙවතු ගසකොළ' යන්නයි. 'කැරගල කුසලාන්' ගම හා මෙහි බද ගෙවතු ගසකොළ[71] 'කුඹුරු බිජුවට දෙයාළ පසමුණක් හා මෙහි බද ගෙවතු ගසකොළ'[72] යනාදිය නිදසුන්ය. මේ නිසා පසු කාලවල ගෙවතු ගසකොළ යන්න යෙදී ඇත්තේ මුල්කල කොළවෙල් යන්න වෙනුවටම යැයි සිතිය හැකිය. ගෙවතු යන්නෙන් සාමාන්‍යයෙන් හැඟී යන්නේ ගෘහාශ්‍රිත වතු යන්නයි. ගස කොළ යන්න සාමාන්‍යයෙන් යෙදෙන්නේ ගස්වැල් යන අරුතිනි. මේ අනුව ගෙවතු ගසකොළ යනු ගෘහාශ්‍රිත වතුවල වගා කරන ලද ගස්වැල් බව පෙනේ. ගෙවතුවල වවන්නේ ගලපාත ලිපියේ සඳහන් අයුරු පොල්, පුවක්, බුලත් වැනි ආදයම් ලැබෙන ගස් වැල් වර්ග බව පැහැදිලිය. මේ නිසා ගලපාත ලිපියේ 'කොළවෙල් අය' යනුවෙන් අදහස් කෙරුණේ එබඳු ගස් වැල්වලින් ලැබුණු ආදායම යැයි සිතීම යුක්ති සහගතය.

### වල්පිට

තවද ඉහත දුටු ප්‍රදානයන්හිදී 'වල් පිට' යන්නක් යෙදී ඇත. 'මෙහි බද ගෙවතු ගස කොළ වල්පිට ඇතුළුවූ තැන්' යනුවෙන් **කිත්සිරි මෙවන් ලිපියේ** එයි.[73] හතර වැනි පරාක්‍රමබාහු අස්ගිරියට පිදූ භූමි භාගයේ සතර සීමා දක්වා එකී කඩයම් තුළ ගෙවතු, ගස කොළ, වල්, විල්, ඇතුළු සියල්ලේ ආරක්ෂාවට ආඥා පණවා ඇත.[74] **පැපිළියාන ලිපියේද** බොහෝ විට සතර සීමා දක්වා ඒ තුළ වූ වල්, විල්පිට සඳහන් කර ඇත. මෙබඳු තන්හි ඇති 'වල්පිට' යන්න සාමාන්‍යයෙන් වගා නො කළ කැලෑ කොටස් සඳහා යෙදුණු කැයි සිතේ. මේවායේ ඇති දැව දඬු ආදිය විහාරයේ ගොඩනැගිලි ආදියට ප්‍රයෝජනවත් වූ අතර එක්තරා ප්‍රමාණයක ආදයමක් ද වූහයි සිතිය හැකිය. ඒ නිසා පිදෙන ඉඩම් තුළවූ වල්පිට ද දීමනාවට විශේෂයෙන් ඇතුළත් කළහයි සිතිය හැකිය.

### විල්පිට

ඉහත දුටු ප්‍රදානයන්හි විශේෂයෙන් 'විල්පිට' ද සඳහන් කොට ඇත. විල්පිට යනු ජලය රඳා සිටිනා භූමි භාගය යන අරුත නගයි. **පැපිළියාන ලිපියේ** 'බොලන්තාව විලට හිමි' යනුවෙන් පටන් ගෙන සතර සීමාව දක්වා මෙකී සතර මායිම ඇතුළුවූ විල්පිට'[75] යන ව්‍යවහාරයෙන් විල්පිට යන්න විල සඳහාම යෙදුණක් බවට පැහැදිලි වෙයි.

මෙසේ කිසියම් සතර සීමාවක් දක්වා ඒ තුළ වූ ඉඩම් හෝ ගමද සඳහන් කොට ඊට අතිරේකව එයට ඇතුළත් ගෙවතු ගසකොළ, වල්පිට, විල්පිට ආදියද විශේෂයෙන් සඳහන් කොට ඇත්තේ ඒවායේ අයිතිය නො මැතිව ද භූමිය පමණක් පිදීමේ සිරිතද පැවති නිසා යැයි අනුමාන කළ හැකිය.

පැපිළියාන විහාරයට විශාල ගම් පුද තිබේ. එබඳු විටක ඒ ගම්වල සතර මායිම් ඉතා සවිස්තරව දක්වා තිබේ. 'සියනෑ රට බද ගිරි දෙරට හිමි' නැගෙනහිරින් ගඟ හා ගල්පොත්තේ ගෙදර තුන් ඉම, විලුගල හා එසේම මේ දිගෙන් වදු තුස්ස ගල්පොත්ත හා

මෙසේම දිගින් ගහ වැටුණු ඇල මුල්ල[76] යන මේ සියලු ළකුණු නැගෙනහිර මායිම සඳහා ය. ඇතැම් විට කිසියම් ගමක එක්තරා භූමි ප්‍රමාණයක් නියම කොට, එය පමණක් වටනා පස සේ පුද තිබේ. වීදගම මෛත්‍රෙය මහතෙරුන්ට වටනා පසයට දී ඇත්තේ 'දඹදෙණි බද මැදගොඩ' යන ගමේ මුල් බිජුවට දෙළසමුණ වපසරියයි.[77] මේ නිසා එම සන්නසේම පසු තැනක 'මැදගොඩ වටනා පස' යනුවෙන් හඳුන්වන විට ඉන් අදහස් වන්නේ මැදගොඩ මුළු ගමම නොව, බිජුවට දෙළසමුණේ වපසරිය පමණක් බව සිහිපත් කළ යුතුය.

**පැපිළියාන ලිපියට** අනුව දිවයිනේ විවිධ ගම්වලින් හා කුඹුරුවලින් කිසියම් ප්‍රමාණයක් නියම කොට ඒවා පිරිවෙනට පුද තිබේ. බෝඹුවලින් මුල් බිජුවට දෙයාළක් හා ගොඩින් පසළොසමුණක්, දෙළොස් දහස් රට මැද ගොඩින්, ගොඩින් පසමුණක් හා කුඹුරු බිජුවට සතමුණක්[78] යන නිදසුන් විමසන විට ගොඩ මඩ දෙකින්ම කිසියම් ප්‍රමාණ නියම කොට දී ඇති බව පැහැදිලි වේ. කුඹුරු බිම් නියම කිරීමේදී කුඹුරට දිය ගලන වැව සම්පූර්ණයෙන්ම ද පුද ඇති සැටි ප්‍රුස්සදේව සුමංගල සාමීන්ට මිල්ලෑව වැවත්, එයින් දිය ගලන කුඹුරුත් පුද ඇති සැටියෙන් පැහැදිලි වෙයි.[79]

මෙසේ සතර මායිම් දක්වා ඇති තන්හි ඒ ඇතුළතවූ සම්පූර්ණ භූමි ප්‍රමාණයද කිසියම් භූමියකින් එක්තරා ප්‍රමාණයක් දක්වා ඇති තන්හි එම කොටස පමණක්ද ප්‍රතිග්‍රාහකයාට අයත් විණැයි පිළිගත හැකිය. එවිට එම භූමිවල නිපදෙන දෙයින් අයිති කරුට කොටසක් හිමිවීම සාමාන්‍ය සිරිතය. මේ වකවානුවේ ඉඩම් හිමියාගේ කොටස කවරේදැයි දැන ගැනීමට නිශ්චිත සාක්ෂි නැත. පොළොන්නරු යුගයේ නම් මෙය සයෙන් පංගුවක් සේ සළකා ඇති බව පරණවිතාන පෙන්වා දෙයි.[80]

## අධෝ ලිපි

1. විස්තර සඳහා බලන්න. ශ්‍රී ලංකාවෙ සංඝ සංවිධානය, මැන්දිස්, රෝහණදිර, 1974, දෙවැනි හා තුන්වැනි පරිච්ඡෙද. 70–166 පිටු.
2. **EZ.**, Vol. V, part. I, p. 210
3. **EZ.**, Vol. **V**, **p. III**, p. 311
4. **EZ.**, Vol. II, **p.** 212
5. මේ මත භේදය ගැන **CLAR**. Vol. X, pt. I, (1924) pp. 6–10
   **EZ.**, Vol. V, pt. I, pp. 143–144
6. **EZ.**, Vol. II, p. 118. Note 2; p. 199. Note 1
7. **CALR**., Vol. X, pt. 1 p. 144
8. **EZ.**, **Vol.** 11, **p.** 95.
9. **දසිං.**, 102; **ශ්‍රීසුශකෝ.**, 266, මෙතැන් සිට **දසි**; යනුවෙන් හැඳින්වෙන්නේ වැලිවිටියේ. ශ්‍රී සෝරත ස්ථවිරයන්ගේ 1955 කොළඹ, දළද සිරිත සංස්කරණයයි. මෙතැන් සිට **ශ්‍රීසුශකෝ** සේ හැඳින්වෙන්නේ වැලිවිටියේ ශ්‍රී සෝරත ස්ථවිරයන්ගේ 1928–33 ශ්‍රී සුමංගල ශබ්දකෝෂයයි.
10. **EZ.**, **Vol. V, pt.** 1, **p.** 144.
11. **EZ.**, Vol. V, **pt.** 111, **p.** 323.
12. **EZ.**, **Vol.** 11, **p.** 106 ඇම්. ද ඉසෙඩ්. වික්‍රමසිංහ කියවා ඇති 'මහ කුසලාන්' යන්න වැරදි බව දැන් පිළිගැනී ඇත. **දසි.**, 102. **CALR**, **X**, **p.**6
13. **දසි.**, 48
14. **CALR.**, Vol. **X**, **p.** 6.
15. **දසි.**, 102.

16. **දසි.**, 102, 103
17. **EZ.,** Vol. 11, **p.** 195
18. **EZ.,** Vol. 11, **p.** 199.
19. **අවං.**, 105. මෙතැන සිට අවං., යනුවෙන් හැඳින්වෙන්නේ ජේම්ස්ද අල්විස්ගේ 1887 **කොළඹ** අත්තනගලු වන්සේ නම් සංස්කරණයයි.
20. **ශ්‍රීසුශකෝ.,** 1052
21. **පුව.,** 116, 139, මෙතැන සිට පුව., යනුවෙන් හැඳින්වෙන්නේ ඒ. වී. සූරවීර, කොළඹ, 1961 පූජාවලිය සංස්කරණයයි.
22. **Tamil Lexicon, Madras,** 1928, Vol. 111, **pt.** 1, **p.** 1457.
23. නුනු රුවනට මවු කුසලාන්ද දරු කුසලාන්ද, ........." දසි., 48.
24. **පුව.,** 122, 135; **කස.**, 13; මෙතැන් සිට **කස.,** යනුවෙන් හැඳින්වෙන්නේ ඩී. බී. ජයතිලකගේ කතිකාවත් සඟරා 1955, කැළණිය මුද්‍රණය.
25. **EZ.,** Vol. IV, **p.** 165
26. **දසි.**, 102.
27. **EZ.,** Vol 1V, **p.** 165
28. **ශ්‍රීසුශකෝ.,** 849.
29. **පුව.,** 135; මව,. 86:3. මෙතැන් සිට **මව.,** යනුවෙන් හැඳින්වෙන්නේ පොල්වත්තේ **ශ්‍රී** බුද්ධ දත්ත ස්ථවිරයන්ගේ **ඌන පූර්ණ** සහිත මහාවංශය, 1959, කොළඹ මුද්‍රණයයි.
30. **ශ්‍රීසුශකෝ.,** 215.
31. "ඉටාගන්නේ වටි" **සිඛවළඳ හා සිඛවළඳ විනිස., ඩී.** බී. ජයතිලක, මහා බෝධි යන්ත්‍රාලය කොළඹ, 1924, 35 පිට. **ධම්පියා අටුවා ගැටපදය., ඩී.** බී. ජයතිලක, 1932, 78. පිට
32. **CALR.,** Vol, 11, **pt.** 1, **p.** 4.
33. **පුව.,** 135; **මව.,** 86:58.
34. **කස.,** 42.
35. **EZ.,** Vol. 111, **p.** 70
36. **සිංසාලි.,** 139.–මෙතැන් සිට සිංසාලි යනුවෙන් හැඳින්වෙන්නේ **ඩී.**බී. ජයතිලකගේ සිංහල සාහිත්‍ය **ලිපි,** 1956, මහරගම, 9 වන මුද්‍රණය.
37. **සිංසාලි.,** 139.
38. **EZ.**, Vol. 111, **p.** 70
39. **EZ.,** Vol. **V, pt.** 111, **p.** 311.
40. **EZ.,** Vol. **V, pt.** 1 **p.** 145
41. **EZ.**, Vol. 1V, **p,** 78.
42. මෙහි අර්ථය පසුව විභාග කෙරේ. ඉදිරිපිට, 15.
43. **EZ.**, Vol. 1V, **p.** 203.
44. **පුව.,** 122.
45. **පුව.,** 135.
46. **EZ.**, Vol. IV, **p.** 161.
47. **දසි.,** 48.
48. **මව.,** 88:87.
49. **පුව.,** 118.
50. **මව.,** 82:4
51. (හිර සඳ පවත්නා තෙක් අයත්වන සේ යන අර්ථයයි) **CALR.,** Vol. 1, **p,** 153.
52. **සිංසාලි.,** 139.
53. **පුව.,** 118. **මව.**, 82:4.
54. **EZ.**, Vol. IV. **p,** 203
55. **EZ.**, Vol. IV. **p.** 89. කැළණි විහාර සන්තක ගම්බිම් ගැන කැළණි විහාර ලිපියේ එයි. **CALR.,** Vol. 11. **p.** 136
56. **පුව.,** 118; මව., 82:4.

57. සංඝ සමාජය – 134 පිට.
58. පුව,. 118.
59. **මව.,** 82:4.
60. **EZ.**, Vol. IV, p, 87.
61. **EZ.**, Vol. IV, p. 87.
62. **EZ.**, Vol. IV, p. 89.
63. සංඝ සංවිධානය, 223.
64. **මව.,** 81:3,4.
65. සංඝ ගාමෙසු සංඝස්ස පුත්ත දරාදි පොසණං,
එව සීලං තතො අඤ්ඤං නෙවත්ථි සීලම්ච්චපි. මව., 76:3.
66. **කස.,** 13.
67. University of Ceylon, History of Ceylon, **UCHC.**, 1, ii, p. 748.
68. **කස.,** 13.
69. **EZ.**, Vol IV. p. 203, lines 5,6
70. **EZ.**, Vol. IV, p. 209, Note 2,
71. **කැරගල ලිපිය, JCBRAS., XXII p.** 352.
72. **කිත්සිරි මෙවන් කැළණි ලිපිය**, **CALR.**, Vol. I. p. 153.
73. **CALR.,** 1, Vol. p. 153.
74. **අකප.,** 6. අස්ගිරියේ තල්පත. මැන්දිස් රෝහණදීර සංස්කරණය. ගංගොඩවිල 1969.
75. **විද්‍යොදය.,** 1, 299.
76. **විද්‍යොදය.,** 1, 415.
77. **අරම්කැලේ සන්නස., සිංසාලි.,** 139...
78. **විද්‍යෝදය.,** 1, 415.
79. **අරම්කැලේ සන්නස., සිංසාලි** 140.
80. **UCHC.,** 1, ii, p, 547.